# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 4 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1993 පෙබරවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල ශත 30 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1993 අංක 4 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 64/91

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 4 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 403 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 15 දරන පනතේ 403 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ඇප දිය නොහැකි යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක යම් අවධියක දී, මහෙස්ත්‍රාත්වරයකු හෝ මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් ස්වකීය අභිමතය පරිදි ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය:

එසේ වුවද, දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 191 වන සහ 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් යම් තැනැත්තකු විසින් සිදුකර ඇතැයි කියනු ලබන්නේ නම්, හෝ සිදුකිරීමෙහිලා ඔහු සම්බන්ධ වූයේ යයි කියනු ලබන්නේ නම්, නැතහොත්, සිදුකර ඇති බවට සැකකරනු ලබන්නේ නම්, හෝ සිදු කිරීමෙහිලා සම්බන්ධ වූ බවට සැක කරනු ලබන්නේ නම්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් හැර, යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක යම් අවධියක දී ඔහු මුදාහරිනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා ඇප පිට මුදාහරිනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට, "මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් හැර, ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.